අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්
General Certificate of Education (Adv. Level) Examination, April 2004

කෘෂි විද්‍යාව I/ පැ දෙකයි
Agricultural Science I/Two hours

වැදගත් : ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නො ලැබේ.

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න. ඉන් පසු ඒ අසල ම පහළින් ඇති අංක සහිත කොටුවල ද අදාළ ලෙස අංකය අඳුරු කිරීමෙන් විභාග අංකය දක්වන්න.
(iii) උත්තර පත්‍රයේ පිටුපස ද ඇති අනෙක් උපදෙස් ද පරෙස්සමෙන් කියවන්න.
(iv) 1 සිට 60 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි අඳුරු කරන්න.

01. තනි මාතෘ ශාකයකින් වර්ධක ව ප්‍රචාරණය කළ ශාක ගහණයක් වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,
(1) ප්‍රභේදයක් ලෙස ය. (2) ප්‍රවේණි දර්ශයක් ලෙස ය. (3) වසා දර්ශකයක් (eco-type) ලෙස ය.
(4) ක්ලෝනයක් ලෙස ය. (5) ජෛව දර්ශයක් (bio-type) ලෙස ය.

02. තද කොළ හා දම් පැහැති පත්‍ර, කුරු ශාක හා මුල් වර්ධනය අඩුවීම ආදී ඌනතා ලක්ෂණ ඇති වනුයේ
(1) Mg අඩු වූ විට ය. (2) Ca අඩු වූ විට ය. (3) Fe අඩු වූ විට ය.
(4) Zn අඩු වූ විට ය. (5) P අඩු වූ විට ය.

03. දුම් ගැසීම මගින් ගබඩා කර තබා ගන්නා කාලය (shelf life) වැඩි කළ හැක්කේ
(1) ගම්මිරිස්වල ය. (2) සුදුළූණුවල ය. (3) ඉඟුරුවල ය.
(4) සාදික්කාවල ය. (5) කරාබු නැටිවල ය.

04. සෛල විභාජනය, සෛල දික්වීම හා අග්‍රස්ථ ප්‍රමුඛතාව උත්තේජනය කරනුයේ
(1) ඔක්සින මගිනි. (2) ගිබරලින මගිනි. (3) සයිටොකයිනින මගිනි.
(5) ඇබ්සිසික් අම්ලය මගිනි. (5) එතිලීන් මගිනි.

05. ක්ෂාරීය පසක වැඩිපුර ම ඇති ක්ෂුද්‍ර පෝෂකය වනුයේ
(1) Mo (2) Fe (3) Zn (4) Mn (5) Cu

06. සහල් නිෂ්පාදනයේ පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලියේ දී වැඩිම අස්වනු හානියක් සිදුවන්නේ,
(1) ඇසුරුම්කරණයේ දී ය. (2) පෑගීමේ දී ය. (threshing) (3) ගබඩා කිරීමේ දී ය.
(4) තැම්බීමේ දී ය. (par-boiling) (5) කෙටීමේ දී ය. (milling)

07. තුත්තනාගම් (Zinc)
(1) අත්‍යවශ්‍ය මහා මූලද්‍රව්‍යයකි. (2) අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයකි. (3) අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයකි.
(4) ශාකවලට විෂ ද්‍රව්‍යයකි. (5) ජිප්සම්වල අඩංගු ද්‍රව්‍යයකි.

08. කිකිළි බිත්තරයක අඩංගු ප්‍රධාන සංඝටකය වනුයේ
(1) ජලය (2) ප්‍රෝටීන (3) මේද (4) කැල්සියම් (5) ඇල්බියුමින්

09. සෝයා බෝංචි අත්තයේ (soya bean meal) අඩංගු සාමාන්‍ය දළ ප්‍රෝටීන ප්‍රමාණය
(1) 20 - 22% කි. (2) 30 - 33% කි. (3) 40 - 44% කි.
(4) 50 - 55% කි. (5) 60 - 66% කි.

10. වසු පැටවෙකුගේ අග්න්‍යාසයෙන් ස්‍රාවය වන ප්‍රධාන ප්‍රෝටීන ජීරක එන්සයිමය
(1) ට්‍රිප්සින් ය. (2) කයිමොට්‍රිප්සින් ය. (3) පෙප්සින් ය. (4) රෙනින් ය. (5) ශ්ලේෂ්මල ය.

11. පුරුෂ ලිංගික හෝර්මෝනයක් සඳහා උදාහරණයක් වනුයේ
(1) ඊස්ට්‍රජන් (2) ප්‍රොජෙස්ටෙරොන් (3) ටෙස්ටෙස්ටෙරෝන්
(4) ඩයි-ඊතයිල් ස්ටිල්බෙස්ට්‍රෝල් (5) තයිරොක්සින්

12. කුකුළන්ට වැළදෙන ගම්බෝරෝ (Gamboro) රෝගයේ හේතු කාරකය වනුයේ
(1) බැක්ටීරියාවකි. (2) වයිරසයකි . (3) දිලීරයකි.
(4) ප්‍රෝටොසෝවාවකි. (5) බාහිර පරපෝෂිතයෙකි.

13. වියළි කලාපීය පසෙහි රතු පැහැයට ප්‍රධාන හේතුව
(1) සිලිකේට් මැටි ඛනිජ තිබීම ය. (2) බොරළු (gravel) තිබීම ය. (3) යකඩ ඔක්සයිඩ තිබීම ය.
(4) ෆෙල්ස්පාර් අධික ඛනිජ තිබීම ය. (5) අධික මැටි ප්‍රමාණයක් තිබීම ය.

Scanned with CamScanner

14. පාංශු ව්‍යයනයට **අඩු ම** බලපෑමක් ඇත්තේ
(1) පසේ අඩංගු මැටි ප්‍රමාණයෙන් ය.
(2) පස් අංශුවල ප්‍රමාණාත්මක ව්‍යාප්තියෙන් ය.
(3) බොරළු ප්‍රමාණයෙන් ය.
(4) පසේ අඩංගු ජලය ප්‍රමාණයෙන් ය.
(5) පසේ අඩංගු රොන් මඩ ප්‍රමාණයෙන් ය.

15. වෙරළාසන්න ව දක්නට ලැබෙන ප්‍රධාන පස් කාණ්ඩය වනුයේ
(1) දියළු පස ය. (2) රෙගොසොල් පස ය. (3) ලවණ පස ය.
(4) ක්ෂාරීය පස ය. (5) ගොහොරු පස (bog soil) ය.

16. දළ ආහාරවල
(1) 18% වැඩියෙන් දළ තන්තු අඩංගු වේ.
(2) 18% අඩුවෙන් දළ තන්තු අඩංගු වේ.
(3) 20% වැඩියෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.
(4) 20% අඩුවෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.
(5) 20% වැඩියෙන් දළ තන්තු හා දළ ප්‍රෝටීන අඩංගු වේ.

17. ගවයාගේ සංකීර්ණ ආමාශයේ කොටස් හතර වනුයේ
(1) රෝමන්ථය, බහුනැමිය, ග්‍රහණිය සහ උණ්ඩුකයයි.
(2) රෝමන්ථය, විතංශිකාව, ග්‍රහණිය සහ ජඨරාශයයි.
(3) රෝමන්ථය, ජඨරාශය, ශේෂාන්ත්‍රකය සහ විතංශිකාවයි.
(4) රෝමන්ථය, ග්‍රහණිය, ශූන්‍යාන්ත්‍රකය සහ උණ්ඩුකයයි.
(5) රෝමන්ථය, විතංශිකාව, ජඨරාශය සහ බහුනැමියයි.

18. රෝගී ගොවිපොළ සතෙකු
(1) නිතර ම උණ ගතියෙන් පෙළේ.
(2) සාමාන්‍ය ලෙස ආහාර අනුභව කරයි.
(3) අනෙකුත් සතුන්ගෙන් වෙන් වී සිටීමට කැමැත්තක් දක්වයි.
(4) පැහැදිලි හා දිලිසෙන ඇස් සහිතය.
(5) නිසියාකාර පරීක්ෂණයකින් තොරව හඳුනා ගත නොහැකි ය.

19. සංකීර්ණ බහුවාර්ෂික වල් පැළ පාලනය සඳහා වඩාත් කාර්යක්ෂම ක්‍රමය වනුයේ
(1) සියල්ල නසන වල්නාශකයක් යෙදීම ය.
(2) තෝරා නසන වල්නාශකයක් යෙදීම ය.
(3) ස්පර්ශ වල්නාශකයක් යෙදීම ය.
(4) පශ්චාත් - නිර්ගමන වල්නාශකයක් යෙදීම ය.
(5) පරිසංක්‍රමණ වල්නාශකයක් යෙදීම ය.

20. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කිරි ගොවීන් අතර කෘත්‍රිම සිංචනය ජනප්‍රිය **නොවීමට** ප්‍රධාන හේතුව
(1) එමගින් පිරිමි වසුපැටවුන් වැඩිපුර බිහිවීම ය.
(2) එය අපගේ කිරි දෙනුන්ට නුසුදුසු වීම ය.
(3) ඒ සඳහා ඇති පහසුකම් සීමාසහිත වීම ය.
(4) ඊට අදාළ තාක්ෂණය ශ්‍රී ලංකාවේ නොමැති වීම ය.
(5) ස්වාභාවික පට්ටි දැමීම සඳහා පට්ටි ගොනුන් අවශ්‍ය තරම් සිටීම ය.

21. ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලන වැඩසටහන්වල දී විලෝපිකයන් බහුල ව යොදා ගැනේ. එවැනි විලෝපිකයකුට උදාහරණයක් වනුයේ
(1) පැළ කීඩෑවා ය. (2) පතංගයා (locust) ය. (3) ලේඩිබර්ඩ් කුරුමිණියා ය.
(4) පලතුරු මැස්සා ය. (5) ගොම කුරුමිණියා ය.

22. ශාක මගින් සාන්ද්‍රණ අනුක්‍රමණයට එරෙහිව අයන උරාගැනීම වඩාත් හොඳින් විස්තර වනුයේ
(1) අක්‍රිය අවශෝෂණයෙනි. (2) සක්‍රිය අවශෝෂණයෙනි. (3) ආසෘතියෙනි.
(4) විසරණයෙනි. (5) ධ්‍රැවීයතාවයෙනි.

23. Azadirachtin, Nimbin Salannin, Meliantriol සහ Nimbidin අඩංගු වනුයේ
(1) කෝමාරිකාවල ය. (2) දුම්කොළවල ය. (3) කොහොඹවල ය. (4) කහවල ය. (5) මදුරුතලාවල ය.

24. ද්විගෘහිතාව අනුවර්තනයක් ලෙස සලකන්නේ
(1) විසංයෝගතාව (apomixis) සඳහා ය.
(2) ස්වපරාගණය සඳහා ය.
(3) පරපරාගණය සඳහා ය.
(4) කෞමාරෝද්භවය (parthenogenesis) සඳහා ය.
(5) වර්ධක ප්‍රචාරණය සඳහා ය.

25. කැල්සියම් ඇල්ජිනේට්වලින් වට කළ විජලනය කළ කලලක (embroids) හඳුන්වන්නේ
(1) සහශ්‍ර බීජ ලෙස ය. (2) දෙමුහුම් බීජ ලෙස ය. (3) ජාන විකරණය කළ බීජ ලෙස ය.
(4) කෘත්‍රිම බීජ ලෙස ය. (5) අභිජනක බීජ ලෙස ය.

26. බීජ ගබඩා කිරීමට වඩාත් සුදුසු තත්ත්ව වනුයේ,
(1) අඩු උෂ්ණත්වය හා ආර්ද්‍රතාවයයි.
(2) අඩු ආලෝක තීව්‍රතාව හා ආර්ද්‍රතාවයයි.
(3) අඩු ආලෝක තීව්‍රතාව හා උෂ්ණත්වයයි.
(4) අඩු වාතනය හා ආර්ද්‍රතාවයයි.
(5) අඩු වාතනය හා උෂ්ණත්වයයි.

Scanned with CamScanner

27. ගොවියෙක් පහතරට වියළි කලාපයේ බහුවාර්ෂික පලතුරු බෝගයක් (උදා : මිදි) වගා කිරීමට සැලසුම් කරයි. මෙම බෝගය සඳහා වඩාත් සුදුසු වාරි ක්‍රමය වනුයේ
(1) බේසම් ජල සම්පාදනයයි.
(2) තීරු ජල සම්පාදනයයි.
(3) විසිරි ජල සම්පාදනයයි.
(4) බිංදු ජල සම්පාදනයයි.
(5) ඇලි ජල සම්පාදනයයි.

28. ද්විබීජපත්‍රී බීජවල,
(1) පරිණත අවස්ථාවේ දී භ්‍රෑණපෝෂය දකිය නො හැකි ය.
(2) බීජ පත්‍ර ක්ෂීණ වූ පටක බවට පත්ව ඇත.
(3) බීජ ලපය හා අනුද්වාරය දකිය නො හැකි ය.
(4) බීජ පත්‍ර වර්ජිකාව ලෙස හැඳින්වේ.
(5) ඵලාවරණය බීජයට තදින් සම්බන්ධ වී පවතී.

29. බීජ සුප්තතාව බිඳිය හැක්කේ
(1) ආමුකුලනයෙනි.
(2) බීජ දවටීමෙනි.
(3) සීරීමෙනි.
(4) ජීවානුහරණය කිරීමෙනි.
(5) පිරිසිදු කිරීමෙනි.

30. එළ කිරිවලින් මී කිරි පහසුවෙන් වෙන්කර හඳුනා ගත හැක්කේ, මී කිරි
(1) සුදු පැහැවීම හා අඩු මේද ප්‍රමාණයක් තිබීමෙනි.
(2) කහ පැහැවීම හා අඩු මේද ප්‍රමාණයක් තිබීමෙනි.
(3) සුදු පැහැවීම හා වැඩි මේද ප්‍රමාණයක් තිබීමෙනි.
(4) කහ පැහැවීම හා වැඩි මේද ප්‍රමාණයක් තිබීමෙනි.
(5) විශේෂිත ගන්ධයක් සහිත නිසා ය.

31. වියළි කලාපයේ බෑවුම් සහිත බිමක් හිමි ගොවියෙකුට එහි විශාල බීජ සහිත බෝගයක් සිටුවීමට අවශ්‍යව ඇත. ඔහුගේ ක්ෂේත්‍රය සඳහා වඩාත් උචිත බිම් සැකසීම වනුයේ
(1) මඩ කිරීම ය.
(2) තැටි නගුලෙන් සී සෑම ය.
(3) පෝරු ගෑම ය.
(4) අවම බිම් සැකසීම ය.
(5) කැට පොඩි කිරීම ය.

- ප්‍රශ්න අංක 32 හා 33 ට පිළිතුරු සැපයීම සඳහා මෙහි දක්වෙන රූප සටහන උපයෝගී කර ගන්න.



32. මෙම වගා පද්ධතියේ ජල සම්පාදනය සඳහා ජලය යෙදිය යුත්තේ
(1) A හා B ට ය.
(2) A හා C ට ය.
(3) B හා C ට ය.
(4) B ට පමණි.
(5) C ට පමණි.

33. රූප සටහනේ C ව්‍යුහය ප්‍රධාන වශයෙන් යොදා ගත්තේ
(1) බෝගයට රසායනික පොහොර යෙදීමට ය.
(2) බෝගයට දියර පොහොර යෙදීමට ය.
(3) ක්ෂේත්‍රයේ සිටින පළිබෝධ අල්ලා ගැනීමට ය.
(4) කාබනික කසළ දැමීමට ය.
(5) ඊළඟ බෝගය ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා ය.

34. මැදරට අතරමැදි කලාපයේ එක්තරා ස්ථානයක 75% අපේක්ෂිත වාර්ෂික වර්ෂාපතනය 900 mm පමණ වේ. මෙම ස්ථානයේ පස රතු දුඹුරු පසෙන්, අපරිණත දුඹුරු ලෝම පසෙන් හා රතු දුඹුරු ලැටසොලික් පසෙන් සමන්විතය. මෙම කෘෂි-පාරිසරික කලාපය වඩාත් හොඳින් නිරූපණය වනුයේ
(1) IU_1 මගිනි.
(2) IU_3 මගිනි.
(3) IM_1 මගිනි.
(4) IM_3 මගිනි.
(5) DL_5 මගිනි.

35. අන්තර් නිවර්තන අභිසාරී කලාපය දකුණට විස්ථාපනය වනුයේ
(1) නිරිතදිග මෝසම් කාලයට ය.
(2) ඊසානදිග මෝසම් කාලයට ය.
(3) අන්තර් මෝසම් කාලවල දී ය.
(4) සියලු ම වර්ෂා කාලවල දී ය.
(5) සියලු ම වියළි කාලවල දී ය.

36. කෙටි දින ශාකවල මල් හටගන්නේ දිවා කාලයේ දිග
(1) අවධි කාලයට වඩා දිගු වූ විට ය.
(2) අවධි කාලයට වඩා කෙටි වූ විට ය.
(3) පැය 12 ට වඩා දිගු වූ විට ය.
(4) පැය 12 ට වඩා කෙටි වූ විට ය.
(5) පැය 12 ට සමාන වූ විට ය.

37. පාංශු වයනය යනු
(1) මතු පිට පසෙහි ඛනිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තියයි.
(2) පසෙහි ඇති රොන්මඩ, මැටි හා වැලි අංශු ප්‍රමාණයයි.
(3) පසෙහි වැලි රොන්මඩ හා මැටි අංශුවල සාපේක්ෂ ප්‍රතිශතයේ ව්‍යාප්තියයි.
(4) පසෙහි මැටි හා රොන්මඩවල බරයි.
(5) මතුපිට පසෙහි ඛනිජ අංශුවල ප්‍රතිශත ව්‍යාප්තියයි.

Scanned with CamScanner

38. ලවණ පසක් වර්ධනය වීමට අවශ්‍ය තත්ත්ව වනුයේ
(1) අධික උෂ්ණත්වය හා සෝඩියම් අධික වාරි ජලයයි.
(2) නිවර්තන දේශගුණය හා ගැඹුරු භූගත ජල මට්ටමයි.
(3) සෝඩියම් අධික වාරි ජලය හා අධික වාෂ්පීකරණ උත්ස්වේදනයයි.
(4) අධික වර්ෂාව සහිත නිවර්තන දේශගුණය හා නොගැඹුරු භූගත ජල මට්ටමයි.
(5) අධික වාෂ්පීකරණය හා නොගැඹුරු භූගත ජල මට්ටමයි.

39. රතු කහ පොඩ්සොලික් යනු ප්‍රධාන වශයෙන්
(1) තෙත් කලාපයේ දක්නට ලැබෙන අධික ලෙස ක්ෂීරණය වූ පසකි.
(2) තෙත් කලාපයේ දක්නට ලැබෙන උදාසීන පසකි.
(3) තෙත් කලාපයේ දක්නට ලැබෙන අධික ලෙස ක්ෂීරණය වූ ආම්ලික පසකි.
(4) අතරමැදි කලාපයේ දක්නට ලැබෙන කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අඩු අධික ලෙස ක්ෂීරණය වූ පසකි.
(5) අතරමැදි කලාපයේ දක්නට ලැබෙන කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය අඩු බාදනය වූ පසකි.

40. උණුසුම් පරිසරයක දී, එළදෙනකගේ කිරි අස්වැන්න අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය හැක්කේ
(1) ආහාර ආගනුව වැඩි වීම හා ජල ආගනුව අඩුවීම ය.
(2) ආහාර ආගනුව අඩුවීම හා ජල ආගනුව වැඩිවීම ය.
(3) අඩු ක්‍රියාශීලී බවය.
(4) ශරීරයෙන් අධික ලෙස ජලය පිටවීම ය.
(5) වැඩිපුර කිරි නිෂ්පාදනයට අවශ්‍ය තරම් ජලය නොමැති වීම ය.

41. පළිබෝධ පාලනයේ දී විලෝපිකයන්, පරපෝෂිතයන් හා තරඟකරුවන් යොදා ගැනීම අර්ථ දක්වන්නේ
(1) ඒකාබද්ධ පළිබෝධ පාලනය ලෙස ය.
(2) ද්විතීයික පළිබෝධ වසංගත ලෙස ය.
(3) කෘෂි පළිබෝධ පාලනයේ සාර්ථක ක්‍රම ලෙස ය.
(4) වගා ක්‍රම මගින් පළිබෝධ පාලනය ලෙස ය.
(5) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනය ලෙස ය.

42. වරක් උරාගත් පසු සමහර විෂ සංයෝග විවිධ ජීවීන්ගේ පටක තුළ දිගු කාලයක් රැඳී පවතී. ආහාර දාමයේ ඉහළ සිටින ජීවීන්ට හා මිනිසාට මෙම දූෂණකාරකවලින් හානි සිදුවීමේ අවදානමක් ඇත. මෙය සිදුවන්නේ
(1) පරිසංක්‍රමණය (translocation) මගිනි.
(2) සංයුක්ත අපවිත්‍රනය (compound contamination) මගිනි.
(3) ශේෂ බලපෑම් (residual effect) මගිනි.
(4) ජෛව හායනය (biodegradation) මගිනි.
(5) ජෛව විශාලනය (biomagnification) මගිනි.

43. ක්ලෝරිනේටඩ් හයිඩ්‍රොකාබන පළිබෝධනාශකවලට වඩා ඕර්ගනික් පොස්පේට් පළිබෝධනාශක ජනප්‍රිය වී ඇත්තේ ඕර්ගනික් පොස්පේට්
(1) වඩාත් විෂ සහිත නිසා ය.
(2) යෙදීමට පහසු නිසා ය.
(3) යනු අර්ධ ජීව කාලය කෙටි පළිබෝධනාශකයක් නිසා ය.
(4) මගින් ගොවිපොළ සේවකයාට ඇති කරන බලපෑම අඩු නිසා ය.
(5) ස්වාභාවික සතුරන් නොමරන නිසා ය.

44. යම් පළිබෝධකයකු සඳහා ආර්ථික අවධි මට්ටම (economic threshold level) වනුයේ
(1) පළිබෝධ හානිය හා හානිය නැවැත්වීමට යන වියදම සමාන වන අවස්ථාව ය.
(2) පළිබෝධ හානිය ප්‍රතිකර්ම මගින් ආර්ථික හානිදායක මට්ටමට පත්වීම වැළැක්විය හැකි ඉහළ ම පළිබෝධ ඝනත්වය වේ.
(3) අස්වැන්නට ආර්ථික හානියක් වීම සඳහා පළිබෝධ ගහණය ඉක්මවිය යුතු මට්ටම ය.
(4) පාලනය කිරීමට වැයවන වියදමට සමාන හානියක් සිදු කරන පළිබෝධ ඝනත්වය ය.
(5) සැමවිට ම ආර්ථික හානිදායක මට්ටමට වැඩි අවස්ථාව ය.

45. වර්තමානයේ වී ගොවීන් පොළඹවන්නේ ක්ෂේත්‍රයට
(1) ගොම යෙදීමට ය.
(2) N, P හා K සහිත මිශ්‍ර පොහොර යෙදීමට ය.
(3) කොළ පොහොර යෙදීමට ය.
(4) ඇමෝනියම් සල්ෆේට් යෙදීමට ය.
(5) පිදුරු යෙදීමට ය.

46. ශාක කිසි දිනක කාබන්, හයිඩ්‍රජන් හා ඔක්සිජන් ඌනතා ලක්ෂණ **නොපෙන්වන්නේ**
(1) රසායනික පොහොර මගින් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
(2) කාබනික පොහොර මගින් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
(3) පසෙන් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබා ගත හැකි බැවිනි.
(4) පාංශු ජලයෙන් හා වායුගෝලයෙන් මෙම මූලද්‍රව්‍ය ශාකයට ලබාගත හැකි බැවිනි.
(5) මෙම මූලද්‍රව්‍ය ශාකය තුළ ම සංස්ලේෂණ කර ගැනීමට ශාකයට හැකි බැවිනි.

47. ශාක අභිජනනයේ දී කොල්කිසීන් (colchicine) භාවිත කරනුයේ
(1) වර්ණදේහ සංඛ්‍යාව දෙගුණ කිරීමට ය.
(2) සෛල විභාජනය නැවැත්වීමට ය.
(3) ඒකගුණ ශාක ලබාගැනීමට ය.
(4) ජාන විකරණය කළ ජීවීන් නිපදවීමට ය.
(5) රෝපණ කාමරය ජීවාණුහරණය කිරීමට ය.

Scanned with CamScanner

48. ගැඹුරු සී සෑම
(1) පාංශු ව්‍යුහය විනාශ කරයි. බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. පාංශු වාතනය දියුණු කරයි.
(2) පාංශු ව්‍යුහය විනාශ කරයි. රෝග හා පළිබෝධ පාලනය කරයි. නමුත් අස්වැන්න අඩු කරයි.
(3) පාංශු ව්‍යුහය දියුණු කරයි. බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව දියුණු කරයි.
(4) පාංශු ව්‍යුහය දියුණු කරයි. පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව දියුණු කරයි. නමුත් අස්වැන්න අඩු කරයි.
(5) බහුවාර්ෂික වල් පැළ පාලනය කරයි. වාතනය දියුණු කරයි. නමුත් පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව අඩු කරයි.

49. පාංශු ප්‍රතිරෝධිතාව අඩු කළ හැක්කේ
(A) පසෙහි ව්‍යුහය හා වාතනය දියුණු කිරීමෙනි.
(B) (B) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙනි.
(C) පසට රසායනික පොහොර එකතු කිරීමෙනි.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A සහ B පමණි. (5) A සහ C පමණි.

50. බෝග සංස්ථාපනයේ දී බීජ සිටුවිය යුතු ගැඹුර
(A) බීජයේ ප්‍රමාණය සහ බීජයේ සංචිත ආහාර ප්‍රමාණය මත රඳා පවතී.
(B) බීජයේ ජීව්‍යතාව සහ බීජයේ අඩංගු ජල ප්‍රමාණය මත රඳා පවතී.
(C) බීජාග්‍රපයේ දිග සහ පසේ අඩංගු තෙතමන ප්‍රමාණය මත රඳා පවතී.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A සහ B පමණි. (5) A සහ C පමණි.

51. ශාක ප්‍රවර්තනය (පැවැත්ම) සඳහා බීජ වැදගත් වන්නේ
(A) ඒවායේ බහුගුණන (multiply) හැකියාව නිසා ය.
(B) (B) ඒවායේ ව්‍යාප්ත කිරීමේ හැකියාව නිසා ය.
(C) ඒවාට අහිතකර තත්ත්ව මග හැරීමට ඇති හැකියාව නිසා ය.

මේ අතරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A,B සහ C යන සියල්ල ම ය.

52. එක්තරා වාරි පද්ධතියක ප්‍රභවයෙන් දිනකට නිකුත් කරන ජලය ප්‍රමාණය ලීටර 5000 කි. නමුත් දෛනිකව වගා බිම වෙත ළඟා වන්නේ ජලය ලීටර 4000 ක් පමණි. මෙම වාරි පද්ධතියේ ජලය ගෙනයාමේ කාර්යක්ෂමතාව
(1) 125% කි. (2) 100% කි. (3) 80% කි.
(4) 20% කි. (5) දී ඇති දත්ත මත ගණනය කළ නොහැකි ය.

53. ගොවියෙක් එක් ජල සැපයුම් චක්‍රයක දී සිය වගා බිමට මිලිමීටර 21 ක් උසට ජලය සපයයි. එම ප්‍රදේශයේ වාෂ්පීකරණ උත්ස්වේදනය දිනකට මිලිමීටර 4 ක් නම්, ජල සැපයුම් චක්‍ර දෙකක් අතර තිබිය යුතු ප්‍රශස්ත කාල අන්තරය
(1) දින 4 කි. (2) දින 5 කි. (3) දින 6 කි. (4) දින 21 කි. (5) දිනපතා ම වේ.

54. බීජ සාම්පලයක තෙතමන ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක දී ලබා ගත් දත්ත පහත දක්වේ.

බීජ සාම්පලයේ ආරම්භක බර	=	ග්‍රෑම් 100
බීජ සාම්පලය නියත බරකට වියළීමෙන් පසු එහි බර	=	ග්‍රෑම් 90

මේ අනුව බීජ සාම්පලයේ තෙතමන ප්‍රතිශතය
(1) 0.1% (2) 1.0% (3) 1.11% (4) 10% (5) 11.1%

55. දෛනික වාෂ්පීකරණ උත්ස්වේදනය මිලිමීටර 4 ක් වූ ප්‍රදේශයක පිහිටි හෙක්ටාර 1 ක වගා බිමකට සැපයිය යුතු අවම දෛනික ජල පරිමාව
(1) 0.04 m^3 (2) 0.4 m^3 (3) 4 m^3 (4) 40 m^3 (5) 400 m^3

56. පොලිතීන් ගෘහ (Poly tunnels) තුළ දී ශාක අතු කැබලිවල මුල් ඇදීම වර්ධනය වනුයේ ප්‍රධාන වශයෙන්
(1) අර්ධ සෙවන තත්ත්වය සහ ඉහළ ආර්ද්‍රතාව නිසා ය.
(2) අර්ධ සෙවන තත්ත්වය සහ ප්‍රශස්ත මට්ටමක ඇති ආර්ද්‍රතාව නිසා ය.
(3) ඉහළ උෂ්ණත්වය සහ ඉහළ ආර්ද්‍රතාව නිසා ය.
(4) ඉහළ උෂ්ණත්වය සහ අර්ධ සෙවන තත්ත්වය නිසා ය.
(5) ඉහළ උෂ්ණත්වය සහ අඩු ආර්ද්‍රතාව නිසා ය.

Scanned with CamScanner

57. වී වගාවකට පොහොර යෙදීමෙන්
(1) මුළු පිරිවැය වැඩි වේ.
(2) විචල්‍ය පිරිවැය සහ මුළු පිරිවැය වැඩි වේ.
(3) ස්ථාවර පිරිවැය සහ මුළු පිරිවැය වැඩි වේ.
(4) සමස්ත පිරිවැය වැඩි වේ.
(5) ප්‍රාග්ධන පිරිවැය වැඩි වේ.

58. භාණ්ඩයක මිල ඉහළ යාමත් සමග නව සමතුලිතතාව කරා එළඹීම සිදුවන්නේ
(1) ආන්තික උපයෝගීතාව වැඩි වීමෙනි.
(2) මුළු උපයෝගීතාව වැඩි වීමෙනි.
(3) මුළු පරිභෝජනය ඉහළ යාමෙනි.
(4) ආන්තික උපයෝගීතාව පහළ යාමෙනි.
(5) මුළු උපයෝගීතාව මුලින් වැඩිවී පසුව අඩු වීමෙනි.

59. ශේෂ පිරික්සුම (trail balance) සාදනු ලබන්නේ
(1) ගිණුම් තැබීමේ කාලය ආරම්භයේ දී ය.
(2) ගිණුම් තැබීමේ කාලය අවසානයේ දී ය.
(3) ශේෂ පත්‍රයෙන් පසුව ය.
(4) ලාභ අලාභ ගිණුමෙන් පසුව ය.
(5) ගිණුම් තැබීමේ කාලසීමාව තුළ දී ය.

60. පිරිවැය වක්‍ර සම්බන්ධතාව වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ
(1) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය, ආන්තික පිරිවැය වක්‍රය හමුවන්නේ ආන්තික පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී ලෙස ය.
(2) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය, ස්ථාවර පිරිවැය වක්‍රය හමුවන්නේ ස්ථාවර පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී ලෙස ය.
(3) සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රය, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හමුවන්නේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී ලෙස ය.
(4) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හමුවන්නේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී ලෙස ය.
(5) ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හමුවන්නේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී ලෙස ය.

*** ** ***

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්

General Certificate of Education (Adv. Level) Examination, April 2004

කෘෂි විද්‍යාව II/ පැ තුනයි

Agricultural Science II/Three hours

මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් **දෙකකින්** යුක්ත වේ. කොටස් දෙකට **ම** නියමිත කාලය **පැ තුනයි.**

A කොටස ව්‍යුහගත රචනා : **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද, දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස රචනා : ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු "A" සහ "B" කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ "A" කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාරදෙන්න. ප්‍රශ්න පත්‍රයේ "B" කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

"A" කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි)

01. (A) (i) පාංශු පී. එච් (pH) අගය අර්ථ දක්වන්න.

....

....

(ii) පාංශු ආම්ලිකතාව අඩු කිරීම සඳහා යොදා ගනු ලබන හුනු අඩංගු ද්‍රව්‍ය වර්ග **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පස් සඳහා ඇමෝනියම් සල්ෆේට් පොහොර නිර්දේශ **නො** කරන්නේ ඇයි?

....

(B) (i) පසක කැටායන හුවමාරු ධාරිතාව අර්ථ දක්වන්න.

....

(ii) පසක භෂ්ම සංතෘප්තිය අර්ථ දක්වන්න.

....

(iii) එක්තරා පසක කැටායන හුවමාරු ධාරිතාව කිලෝග්‍රෑමයට සෙන්ටිමවුල (cmol/kg) 17 කි. මෙම පසෙහි හුවමාරු විය හැකි හයිඩ්‍රජන් සහ ඇලුමිනියම් අයන ප්‍රමාණය කිලෝග්‍රෑමයට සෙන්ටිමවුල (cmol/kg) 5.7 කි.

....

ගණනය කරන්න ;

(1) මෙම පසේ අඩංගුවන භාෂ්මික කැටායන ප්‍රමාණය

....

....

(2) මෙම පසේ භෂ්ම සංතෘප්ත ප්‍රතිශතය

....

....

(iv) පසක කැටායන හුවමාරු ධාරිතාවයේ ඇති ප්‍රධාන වාසිය දක්වන්න.

....

....

(v) **ඉතාම නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.**

(1) මැටි ඛනිජ සමග සසඳන විට පාංශු හියුමස්වල කැටායන හුවමාරු ධාරිතාව

(වැඩි ය. / අඩු ය. / ආසන්න වශයෙන් සමාන ය.)

මාස්ටර් ගයිඩ් ප්‍රකාශනයකි

Scanned with CamScanner

(2) මොන්ට්මොරිලොනයිට් මැටි ඛනිජ සමග සසඳන විට කෙඕලිනයිට් මැටි ඛනිජවල කැටායන හුවමාරු ධාරිතාව (වැඩි ය. / අඩු ය. / ආසන්න වශයෙන් සමාන ය.)

(3) ක්ෂාරීය පසක් සමග සසඳන විට ආම්ලික පසක භෂ්ම සංතෘප්තිය (වැඩි ය. / අඩු ය. / ආසන්න වශයෙන් සමාන ය.)

(C) ● අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දක්වෙන රූප සටහන යොදාගන්න.



(i) ඉහත රූප සටහන මගින් නිරූපණය කෙරෙන උපකරණය නම් කරන්න.

....

(ii) ඉහත රූප සටහනේ A සිට C දක්වා කොටස් නම් කරන්න.

A. ....

B. ....

C. ....

(iii) "C" ලෙස නම් කර ඇති කොටසේ විශේෂ ලක්ෂණය කුමක්ද ?

....

....

(iv) මෙම උපකරණය සඳහා ප්‍රශස්ත pF පරාසය කුමක් ද?

....

(D) (i) **ඉතාම ගැළපෙන වචනය / වාක්‍ය ඛණ්ඩය යටින් ඉරක් අඳින්න.**

(1) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ දී සීඝ්‍ර වර්ධනයක් අපේක්ෂා කළ හැක්කේ මෙම ව්‍යුහ තුළ (ඉහළ / පහළ / නියත) උෂ්ණත්වයක් පවතින නිසා ය.

(2) ලතු ගෘහ (lath house) ප්‍රධාන වශයෙන් භාවිත කරනුයේ ශාකවලට (අර්ධ සෙවන තත්ත්වයක් / සම්පූර්ණ සෙවන තත්ත්වයක් / වැඩි සූර්යාලෝකය ප්‍රමාණයක්) ලබා දීම සඳහා ය.

(3) ඉහළ ම හරිතාගාර ආවරණයක් අපේක්ෂා කළ හැක්කේ (පොලිතීන් ගෘහ / ලතු ගෘහ / දැල් ගෘහ) තුළ ය.

(ii) විදේශීය කොළ එළවළු (exotic leafy vegetable) වගා කිරීමේ දී ශාක ප්‍රචාරණ ව්‍යුහ භාවිතයෙන් ලබා ගත හැකි ප්‍රධාන වාසි **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

Scanned with CamScanner

02. (A) (i) ජෛව පාලනය සඳහා යොදා ගන්නා ජීවී කාණ්ඩ **තුනක්** නම් කර එම එක් එක් කාණ්ඩයක් සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.

	ජීවී කාණ්ඩය	උදාහරණය
(1)	....	....
(2)	....	....
(3)	....	....

(ii) විදීමේ සහ උරාබීමේ මෞඛ උපාංග සහිත කෘමීන්ගෙන් බෝග වගාවට සිදුවන ප්‍රධාන **අනියම්** (වක්‍ර) බලපෑමක් සඳහන් කරන්න.

....

(iii) ඒකාබද්ධ පළිබෝධ පාලනයේ මූලික මූලධර්ම **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(B) වාණිජ වශයෙන් කැපූ මල් කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා රෝගවලින් තොර කානේෂන් පැළ විශාල ප්‍රමාණයක් කෙටි කාලයක් තුළ දී ලබා ගැනීමට ගොවියෙකුට අවශ්‍ය විය. මෙම කාර්යය සඳහා ඔහු ප්‍රරෝහ අග්‍ර භාවිත කරන ලදී.

(i) මෙම ගොවියාට යොදා ගත හැකි වඩාත් සුදුසු ප්‍රචාරණ තාක්ෂණය කුමක් ද?

....

(ii) ගොවියා ප්‍රචාරණය සඳහා ප්‍රරෝහ අග්‍ර යොදා ගත්තේ ඇයි ?

....

(iii) වර්තමානයේ දී ශ්‍රී ලංකාව වැදගත් ආහාර බෝගයක් ප්‍රචාරණය කිරීමට මෙම ප්‍රචාරණ තාක්ෂණය යොදා ගනී. මෙම බෝගය කුමක් ද?

....

(C) (i) බීජවල ජීව්‍යතාව පරීක්ෂා කරන ක්‍රම **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) බීජයක පහත දක්වා ඇති එක් එක් කොටසක ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

(1) බීජාවරණය ....

(2) භ්‍රෑණපෝෂය ....

(3) බීජාග්‍රපය ....

(4) බීජමූලය ....

(D) (i) වගා බිම් තුළ පොහොර කාර්යක්ෂමතාව වැඩි කළ හැකි ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) කාබනික පොහොරවල ප්‍රධාන **අවාසි දෙකක්** ලියා දක්වන්න.

(1) ....

(2) ....

Scanned with CamScanner

03. (A) අර්තාපල් නිෂ්පාදනයේ දී මිල හා ප්‍රමාණය අතර සම්බන්ධතාව පහත සටහන මගින් පෙන්වයි. සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට පෙර සමතුලිත මිල හා ප්‍රමාණය පිළිවෙලින් P_2 සහ Q_2 වේ.



(i) නියත ඉල්ලුම් තත්ත්වය යටතේ, පොහොර සහනාධාර ක්‍රමයක් හඳුන්වා දුනහොත් නව සැපයුම් වක්‍රය කුමක් ද?

....

(ii) ඉහත තත්ත්වය යටතේ, නව ඉල්ලුම් වක්‍රය කුමක් ද?

....

(iii) නව සමතුලිත මිල සහ ප්‍රමාණය කුමක් ද ?

....

(iv) පාරිභෝගිකයාගේ ආදායම ඉහළ යාමක දී ඇති වන ප්‍රතිඵලය කුමක් ද?

....

(v) ආදායම ඉහළ යාමත් සමඟ, සහනාධාර ක්‍රමය යටතේ සමතුලිත ලක්ෂ්‍යයේ ඔබ නිරීක්ෂණය කරන වෙනස කුමක් ද?

....

(iv) පහත සඳහන් අවස්ථා දෙක යටතේ දී නිෂ්පාදන පිරිවැය සම්බන්ධයෙන් කුමන බලපෑමක් සිදු වේ ද?

(1) සහනාධාර ක්‍රමය හඳුන්වා දීම

....

(2) පාරිභෝගිකයාගේ ආදායම ඉහළ යාම

....

(B) (i) ප්‍රති - උත්ස්වේදන කාරක ආකාර **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) පුටිකා විවෘතවීම කෙරෙහි බලපාන සාධක **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) ශාකවල බින්දුදය ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන කාලගුණික සාධකය කුමක් ද?

....

(C) (i) සංරක්ෂණ ගොවිතැනේ දී සංරක්ෂණය කළ යුතු ප්‍රධාන සාධක **තුන** මොනවාද ?

(1) ....

(2) ....

(3) ....

Scanned with CamScanner

(ii) ශ්‍රී ලංකාවේ වාණිජ වන වගාව සඳහා සුදුසු ශාක විශේෂ තුනක් නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) හේන් ගොවිතැනේ වාසි දෙකක් සහ අවාසි දෙකක් සඳහන් කරන්න.

වාසි

(1) ....

(2) ....

අවාසි

(3) ....

(4) ....

(iv) මිශ්‍ර බෝග වගාව අර්ථ දක්වන්න.

....

....

04. (A) පහත රූප සටහනේ දැක්වෙන්නේ කුකුළකුගේ ආහාර මාර්ග පද්ධතිය වේ.



(i) ඉහත රූප සටහනෙහි A සිට D දක්වා කොටස් නම් කර ඒ එක් එක් කොටසේ ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

කොටසේ නම	ප්‍රධාන කාර්යය
A.	....
B.	....
C.	....
D.	....

(ii) මෙම කොටස් අතරෙන් ඌරාගේ ආමාශයට භෞතවේදී ව ගැළපෙන කොටස නම් කරන්න.

....

(B) (i) කුකුළාගේ හා ගවයාගේ පුරුෂ ප්‍රජනක පද්ධති අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(1) ....

(2) ....

(ii) කිකිළියගේ ප්‍රජනක පද්ධතියේ පහත දී ඇති එක් එක් ක්‍රියාවට අදාළ කොටස හෝ ස්ථානය හෝ නම් කරන්න.

ක්‍රියාව	ප්‍රජනක පද්ධතියේ අදාළ කොටස හෝ ස්ථානය
(1) බිත්තර කහමදය නිපදවීම හා මුදා හැරීම	....
(2) බිත්තර සුදුමදය සෑදීම	....
(3) බිත්තර පටලය සෑදීම	....
(4) බිත්තර කටුව සෑදීම	....

(iii) එළදෙනකගේ මද ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iv) ගවයින් සඳහා අභිජනන ක්‍රමයක් ලෙස ස්වාභාවික පට්ටි දැමීමේ ඇති අවාසි **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(C) (i) ප්‍රෝටීන පරිපූරක ආහාර සංඝටක **දෙකක්** සහ ශක්ති පරිපූරක ආහාර සංඝටක **දෙකක්** නම් කරන්න.

ප්‍රෝටීන පරිපූරක

(1) ....

(2) ....

ශක්ති පරිපූරක

(3) ....

(4) ....

******

Scanned with CamScanner

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්

General Certificate of Education (Adv. Level) Examination, April 2004

කෘෂි විද්‍යාව II

Agricultural Science II

"B" කොටස - රචනා

* ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.)

05 (i) ගොවිපොළ සතුන්ගේ රෝග වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න.
(ii) බිම් සැකසීමේ විවිධ පියවර විස්තර කරන්න.
(iii) (a) ආහාර සැකසීමේ ක්‍රම **තුනක්** දක්වන්න.
(b) ආහාර සැකසීමේ දී ආහාරවල ඇතිවන භෞතික සහ රසායනික වෙනස්කම් විස්තර කරන්න.

06 (i) කෘමිනාශක ඉසීමේ දී යොදා ගත යුතු පූර්ව ආරක්ෂක උපක්‍රම විස්තර කරන්න.
(ii) පාංශු ජනක සාධක ලැයිස්තු ගත කරන්න. පාංශු ජනනයට මෙම සාධක බලපාන්නේ කෙසේදැයි විස්තර කරන්න.
(iii) වී අස්වනු නෙළන කාලයේ දී, ලාභය ආන්තික කරමින් ගොවි බිමෙහි දී වී මිල පහත වැටෙයි. මෙම තත්ත්වය වළක්වා ...
හැකි ක්‍රම විස්තර කරන්න.

07. (i) "එක්තරා භාණ්ඩයක නිෂ්පාදනය අඩු වීමට එහි මිල වැඩි වීම බලපායි." නිෂ්පාදන න්‍යාය (theory of production) යොදා ගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇති පාංශු කාණ්ඩය කුමක් ද? මෙම පසෙහි බෝග වගා සි...
ආශ්‍රිත ව පැන නගින ගැටලු සහ එම ගැටලු නිරාකරණය කර ගැනීමේ මාර්ග විස්තර කරන්න.
(iii) ජල සැපයුම් කාලාන්තරය තීරණය කිරීමේ දී සැලකිය යුතු සාධක විස්තර කරන්න.

08 (i) නිසියාකාර ව එළදෙනකගේ කිරි දෙවීමේ පියවර නිවැරදි අනුපිළිවෙලින් විස්තර කරන්න.
(ii) විවිධ බෝග සංස්ථාපන ක්‍රම විස්තර කරන්න.
(iii) බීජ සුප්තතාව යනු කුමක් ද? බීජ සුප්තතාවට බලපාන සාධක මොනවා ද?

09 (i) ජාන ප්ලාස්ම (germplasm) සංරක්ෂණයේ ඇති වැදගත්කම විස්තර කරන්න.
(ii) ශාකයකට අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ලැයිස්තු ගත කරන්න. එම මූලද්‍රව්‍ය ශාකයකට අත්‍යවශ්‍ය මන්දැයි පැහැදිලි කරන්න.
(iii) බෝගවලට වල් පැළෑටි මගින් සිදුවන හානිදායක බලපෑම් පැහැදිලි කරන්න.

10 (i) ශාකයක පැවැත්ම උදෙසා ජලයේ ඇති වැදගත්කම විස්තර කරන්න.
(ii) කෘෂි - වනාන්තර යනු කුමක් ද? කෘෂි - වනාන්තරවල පරිසර විද්‍යාත්මක වැදගත්කම විස්තර කරන්න.
(iii) කඳුකර ප්‍රදේශවලට සුදුසු විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.

Scanned with CamScanner